7.3. සීමිත බඳවා ගැනීම :- අදාල නොවේ

7.4. කුසලතා බඳවා ගැනීම

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ

7.4.2.3. පළපුරුද්ද :

රාජ්‍ය සේවයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙහි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරෙහි I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයෙකු වීම.

7.4.2.4. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කාරියන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු ය.

V. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබිය යුතුය.

VI. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කාරියන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

